# අනන්තය



## ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න

රත්න ශ්‍රී ගේ උපහාර උලෙලක් අගෝස්තු 24 සංවිධානය කරල මටත් එන්න කියල තිබුණා. ඒත් මන් එතනට ගියහම යි දැනගත්තේ ගායකයෝ ගිත රචකයෝ ආදීන් මිස රසිකයෝ එතරම් හිටියේ නැති බව. අඩු තරමේ ඇමතිවරු වගේ අයවත් හිටියේ නෑ. ඒ සංවිධායකයො ඒ නිසාම සැමරුම එවේලෙම කල් දැම්ම. හුග දෙනෙක් ගියේ බැන බැන. ඇත්තට ම එහෙම අඩුවක් කරනවට වඩා කල් දමපු එක හොඳයි. මොකද මට වුනත් රත්න ශ්‍රී ගේ කවි වලට වඩා ගීත ගැන ලොකු ඇල්මක් ඇතිවෙලා තිබුන එක කාලයක. මන් හිතන්නේ එහෙම රසිකයෝ විශාල පිරිසක් ඉන්නව කියල යි. කොහොමටත් සංවිධායකයො නම් මට පෙනුනේ ජාතිවාදී යුධවාදීන් බවයි. දැන් මේ රැල්ලට අසු නොවුන අය ඉන්නේ ඉතාම සුළු දෙනෙක් නිසා ඒ උඩම ඔවුන්ගේ ප්‍රයත්නය පිටු දකින්න බෑ. ඒ නිසයි මන් ඔවුන් පලකල සමරු කලාපය කියවල බැලුවේ.

එහිදී අජන්තා රණසිංහ මෙහෙම කියල තිබුණා. "....... ඇතැම් විට සමහරු කියනව රත්න ශ්‍රී ලියන ගීත තේරෙන්නේ නෑ කියල. ඒක වෙනම කතන්දරයක්. අපි මේක මෙහෙම කියමු. චිත්‍ර ශිල්පියෙක් අඳිනවා චිත්‍රයක්. ඕනාම කෙනෙකුට තම තමන්ට කැමති විදියට අර්ථ දක්වන්න පුළුවන්....... එනිසා කෘතිය ගැන එකම ආකාරයෙන් හිතන්න ඕන නැහැ......"

කලාව හා අදහස් දැක්වීම එකම නොවෙයි කියල මන් හැම වෙලාවේම කියනව. අදහස් නිශ්චිත විය යුතුයි. තර්කානුකූල විය යුතුයි එහෙම නැත්නම් ඒ අදහස් වලින් වැඩක් නෑ. ඒත් කලාව ඒ විදියට තර්ක රාමුවක් තුල නෑ. එයින් ඇතිවෙන්නේ හැඟීම්. එයින් දනවන්නේ වේදනා. වේදනා වලටත් පිළිවෙලක් තියෙනව. ඒත් තර්කානුකූල නෑ. ඒකෙ පිළිවෙල වෙනස්. වචන භාවිතා කලාට කවියක් ඒ අනුව තර්කයෙන් වටහා ගන්න බෑ. ඒ වදන් වලින් ඇතිවන, ජනිත කරන, හැඟීම් හරහා යන්න ඕන. ඒ අනුව තමා විඳීම ලැබෙන්නේ, හැඟීම් ඇති වෙන්නේ. මේ අනුව අදහසක් දීමයි හැඟීම් අඳුන්වා දීමයි සන්සංදනය කරන්න බෑ. රත්න ශ්‍රී විජේසිංහ ඉතා සියුම් ලෙස හැඟීම් හඳුන්වා දුන් නූතන කවියෙක් හා ගීත රචකයෙක්. එයාට පුළුවන් වුනා ඉතාම නිරවුල්ව හැඟීම් ජනිත කිරීමට අදාල වදන් භාවිතා කරන්න. ඒක තමා සැබෑ කිවියෙකුගේ හැකියාව. අජන්තා මෙහෙම කියනව. "... හදවත කම්පනය කරනා ගීතයක් නම් අන්න කලා කෘතියක් බිහිවෙලා. ඒක තමා හොඳ ගීතයක තිබිය යුතු වන්නේ......" මන් ඒ අදහසට මුලුමනින්ම එකඟයි. අදහස් දැක්වීමකින් වැටහීමක් ඇතිවෙන්න ඕනෑ වගේම කලාවකින් කම්පනයක් මනසට දැනෙන්න ඕන.

ඊලඟට මන් කැමතියි සමන් කුමාර කියන දෙයත් විමසා බලන්න. ඔහු කියනව මෙහෙම. "..... රත්න ශ්‍රී පැහැදිලිවම ජනතාවාදී කවියෙකු විය. එහෙත් ජනතාවාදයේ එන බරපතල දෘෂ්ඨිවාදී පීලි පැනීම්වලින් ඔහු විතැන්විය....." මේ අය කියන ජනතාවාදී කවිය මොකක්ද කියල මට නම් පැහැදිලි නැහැ. ඒත් හැඟීම් නම් කොටස් දෙකකට කඩන්න පුළුවන්. එකපැත්තකින් පුද්ගල සම්බන්ධය උඩ ඇතිවන ආදර, අනාදර හැඟීම් හා අනෙකුත් පුද්ගල අත්විඳීම් මත ඇතිවන



හැඟිම්. අනෙක් අතට සමාජ කුලකයනට පොදුවේ ඇතිවන අත්දැකීම් තුල ජනිත වන හැඟිම්. මෙවැනි හැඟීම් පුද්ගලයෙකුට ඇති වුනත් එය ඒ හා සමඟම වැඩි පිරිසක් අත්විඳි හැගීම් වෙන්න පුළුවන්. බාටා වැඩ වර්ජනයේ නායකත්වයේ හිටපු ඩයස් සහෝදරයා එම සටන තුල තමන්ට ඇතිවුන වේදනාවන් ගැන කථා කරන කොට මට තේරුණ ඒවා පොදුවේ අනෙක් බාටා කම්කරුවන් අත්විඳි වේදනා බව. සමහරවිට මේ විදියට පීඩිත ජන කොටස් වල පොදු වේදනාවන් දැක්වීම ජනතාවාදී කවිය හැටියට හඳුන්වනවා වෙන්න පුළුවන්. රත්න ශ්‍රී සමාජ අරගලය තුල බැට කාපු කෙනෙක්. ඒ අනුව ඔහුට එම ජන වේදනාවන් හඳුනාගන්න පුළුවන් වුනා.

හැබැයි මේ වගේ පොදු වේදනා තියෙන්නේ පෑගෙන පංතියට පමණක් නොවෙයි. බිඳ වැටෙන පාලක පංතීන්ටත් ඔවුන්ගේ ඇදහීම් ලොකුයි. මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් සමාජය දේව භක්තිය ඉහලට එසෙව්වා. ඒ හුදී ජනයා වශී කරගන්නට. ඒත් තමනුත් එම භක්තියට යට වුනා. මයිකල් ඇන්ජලෝ ගේ කාලයේ කලාව තුල ඔවුන්ගේ සංකීර්ණ භක්තිමය හැඟීම් සම්භාව්‍ය කලාවට මුල් වුනා. එක තේරුමකින්

> ***කලාව හා අදහස් දැක්වීම එකම නොවෙයි කියල මන් හැම වෙලාවේම කියනව. අදහස් නිශ්චිත විය යුතුයි. තර්කානුකූල විය යුතුයි එහෙම නැත්නම් ඒ අදහස් වලින් වැඩක් නෑ. ඒත් කලාව ඒ විදියට තර්ක රාමුවක් තුල නෑ. එයින් ඇතිවෙන්නේ හැඟීම්. එයින් දනවන්නේ වේදනා. වේදනා වලටත් පිළිවෙලක් තියෙනව. ඒත් තර්කානුකූල නෑ. ඒකෙ පිළිවෙල වෙනස්. වචන භාවිතා කලාට කවියක් ඒ අනුව තර්කයෙන් වටහා ගන්න බෑ. ඒ වදන් වලින් ඇතිවන, ජනිත කරන, හැඟීම් හරහා යන්න ඕන.***

ඒවාත් එහෙනම් ජනතාවාදී කලාවන්. මොකද? එදා සිටි පාලනය සමඟ බැඳුන ජනතාවගේ භක්තිය හා ඇදහීම් වල තියුණු තැන් එයින් පෙන්වන නිසා. එදා 1970 ගණන් වල ඊනියා සමාජවාදීන්ගේ පෙරලිය තුල විවිධ දේවල් ජන සතු කලා. තනි රටක සමාජවාදය ගොඩනග න්න බෑ කියපු මිනිස්සුම කුඩා රටක හැම දේම ජනසතු කිරීමේ වියරුවකට යොමු වුනා. මරදානේ බුහාරි හෝටලයත් ජනසතු කලා. එදා මේ ජනසතු කිරීම් නිසා දේශීය ධනපති කොටසුත් වේදනාවට පත්ව ජනතා විරෝධය සමඟ පෙල ගැසුනා. එක තැනක මන් දන්න ලොකු දේශීය ධනපතියෙක් තමන්ගේ සියළු දේ ජනසතු කරද්දී මුද්‍රණාලය පමනක් බේරා ගැනීමට දරපු වෑයම ගැන අනුවේදනීය කථා - වක් කරල තිබුණා. එම වේදනාව එවැනි ලොකු කුඩා ධනපති පිරිසකට පොදු වේදනාවක් වන්න පුළුවන්. මේ වේදනාවන් පෙල ගස්වන කවියක් ලියැවුනොත් එයත් ජනතාවාදී වෙනව ද?

මේ විදියට සමාජගත වේදනාවන් ගැන කලාවක් ඇතිවීම ජනතාවාදී ද යන්න කතා කිරිම තේරුමක් නැති දෙයක් වෙනව. කලාව ජනතාවාදී ද නැද්ද යන්නට වඩා කලා කෘතිය කොතරම් කලාත්මක ද යන්න විමසා බැලිය යුතුයි. අනෙක් අතට නව්‍ය පුළුල් වේදනා හඳුන්වා දෙන කලාවකින් මතු කරවන කැපවීම්, භක්තීන් හා ආශ්වාදයන් මොන පංතියට අයත්ද යන්න සොයා බැලීම වැදගත් වුවත් එයින් කලා කෘතියට වටිනාකම් දීම හොඳ දෙයක් නෙමෙයි. එහෙම කරන්නට යෑම තුල සම්භාව්‍ය කලාව කුණු ගොඩට දැමිය යුතුය යන සටන් පාඨය මතු වෙන්නත් පුළුවන්.

රත්න ශ්‍රී 1970/80 දශක වල නිර්ධන පංතික ජනතාවට මුහුණ දෙන්නට වූ වේනාවන් තුල ඉස්මතුව ආ අත්දැකීම් කවිය, ගීතය තුලින් එලියට දැමීම නිසා ම පංතීන්ගේ ප්‍රකාශණයක් වූ බව ඇත්ත. ඒ නිසා ම නිර්ධන එඩිතරයන් හා වාම බුද්ධිමතුන් විශාල වශයෙන් ඔහුගේ ගීත ප්‍රිය කලා. එහෙත් ඒ උඩම ඔහු ප්‍රබුද්ධ කවියෙක් වෙන්නේ නෑ. ඇත්තට ම ඔහු ප්‍රබුද්ධ කවියෙක් වෙන්නේ තමන් දනවන හා ජනිත කරන හැඟීම් මොන දේ වුනත් එය උසස්ම වදන් සංයුතියක් තුලින් අපට දැක්වූ නිසයි.

# JOURNEY OF SRI LANKANS IN VICTORIA

## *Dr Olga Mendis'reply*

We refer to the piece by Dr Olga Mendis published in Sannasa's August issue and relating to our column's review of her publication: Journey of Sri Lankans in Victoria.

Dr Olga Mendis had obtained a grant of an undisclosed amount from VMC to present a book about Sri Lankans in Melbourne. Thus, she has been a beneficiary of public funds contributed by taxpayers. She had therefore a responsibility cast on her to perform a public duty in the sense of duty by the taxpayers and duty by the Sri Lankans in Melbourne. Her furious reaction to a professional review presented in this column reflects a different thinking where she believes she is not accountable to the community for what she does with the money.

Dr Mendis is content with the flattering messages of VIPs carried in the preliminary pages of the book. It is common knowledge that to VIPs this kind of message writing is a mere PR exercise where they say nice things to please. Such messages are usually written for them by either the publishers themselves or by their staff typically without even reading the contents of the works concerned. They are never regarded as testimony except by those prone to self-deception.

In our review we have pointed out with hard facts that the book has no useful purpose other than to serve as desultory memoirs of a teeny proportion of Sri Lankans in Victoria; that it is hopelessly slipshod; and that it is biased. Dr Mendis has wasted away a great opportunity for Sri Lankans. She tries to pass the buck to the "editorial board" hardly realizing that the editors' note clearly states that they were not responsible for the contents and that they merely corrected expression.

- SJ

### *"මේ වංචණිකයන්ට අසු නොවන්න" කරුණු පැහැදිලි කිරීමක්*

සන්නස පසුගිය කළාපයේ පළවූ "මේ වංචණිකයන්ට අසු නොවන්න" මැයෙන් ව්‍යාජ ටෙලිකොම් සමාගම් සමබන්ධව වූ පුවත එංගලන්තයේ සිට ක්‍රියාත්මක වන VX Telecom සමාගමට අදාල නොවන බව කරුණාවෙන් සළකන්න.
තම සමාගම ඉතා විශ්වාසවන්ත ලෙස සිය කටයුතු ක්‍රියාත්මක කරමින් සිටින බවත් තම සමාගම හරහා දුරකතන පහසුකම් ලබාගැනීමේදී කිසිදු ආකාරයක අපහසුතාවක් සිය පාරිභෝගිකයනට සිදු නොවන්නට තමන් වග බලා ගන්නා බවත් එම ආයතනය අපට දන්වා ඇත. තම සමාගම ඉදිරියටත් එම විශ්වාසය සුරකින බව ද VX Telecom සමාග ම පවසයි.

